හිටපු විභාග කොමසාරිස්වරයෙකු මෝටර් රථය තුළ මිය යෑමේ පුවත මාධ්‍ය තුළ වාර්තා කර තිබූ ආකාරය පාඨකයින් විසින් Ethics Eye අවධානයට යොමු කර තිබිණි.

මෙය මව්බිම සහ ලංකාදීප පුවත්පත් ඔස්සේ වාර්තා කෙරී තිබිණි. ලංකාදීප පුවත්පත තුළ එම සිදුවීම වාර්තා කොට තිබුණත්, කිසිදු ඡායාරූපයක් පළ වී නොතිබුණි. මව්බිම පුවත් වාර්තාව සමගින් එම පුද්ගලයා මෝටර් රථය තුළ ජීවිතක්ෂයට පත්ව හිඳිනු දැක්වෙන ඡායාරූපයක් පළ කොට තිබුණි. අප විසින් 19, 20, 21 තෙදින තුළ නිරීක්ෂණය කළ ඉංග්‍රීසි භාෂා පුවත්පත් කිසිවක මෙම පුවත පළව නොතිබුණි.

මෙවන් ඡායාරූපයක් පළවීම ඔස්සේ විශේෂයෙන්ම ජීවිතක්ෂයට පත්වූ අයගේ පවුලේ අයට සිත්වේදනාවන් ඇතිවනු ඇතැයි ඔබ සිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima